සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තුන්වන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## ඉස්ලාම්

කාලය පැය 2

නම / විභාග අංකයඃ

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ඉස්ලාමීය දින දර්ශනයේ රමධාන් මාසය කී වැනි මාසයද?
    (i) 8 (ii) 9
    (iii) 10 (iv) 12

02. පව්වලින් අප පිරිසිදු කරන්නා වූ මාසය වන ''ඔබගේ පැමිණීම සාදරයෙන් පිළිගනිමු'' යන වදන,
    (i) මුහම්මද් (සල්) තුමාණන්ගේ (ii) අබූබක්කර් (රලි) තුමාගේ
    (iii) උමර් (රලි) තුමාගේ (iv) උස්මාන් (රලි) තුමාගේ

03. ''සකාත්'' යන වචනයේ භාෂාමය අර්ථය වන්නේ,
    (i) පිරිසිදු බව (ii) බදු
    (iii) දේපල (iv) මුදල්

04. ''යතීම්'' යන පදය හැඳින්වෙන්නේ,
    (i) අනාථ (ii) පොහොසතා
    (iii) ගුරුවරයා (iv) විද්වතා

05. අල්ලාහ් විසින් පහල කරන ලද අවසන් දේව ග්‍රන්ථය,
    (i) තව්රාත් (ii) සබූර්
    (iii) ඉන්ජීල් (iv) ෆුර්කාන්

- ඉතා නිවැරදි පදය තෝරා හිස්තැන් පුරවන්න.
  (හිබ්රු, අබුල් බශර්, මුඃජිසා, දු ආ, අල් අමීන්, ඉක්ලාස්)

06. මූසා (අලෛ) තුමාණන්ට තව්රාත් නම් දේව ග්‍රන්ථය .................................................. භාෂාවෙන් පහළ විය.

07. අරාබි භාෂාවෙන් ප්‍රාතිහාර්ය .................................................. යනුවෙන් හඳුන්වයි.

08. ආදම් (අලෛ) තුමාණන් .................................................. යන විශේෂිත නාමයෙන් හැඳින්විය.

09. ....................................

10. කුරේෂිවරුන් මුහම්මද් (සල්) තුමාණන්ව .................................................. යන නාමයෙන් හැඳින්වූහ.

- පහත සඳහන් කරුණු නිවැරදි නම් (✓) යනුවෙන්ද වැරදි නම් (✗) යනුවෙන්ද සඳහන් කරන්න.

11. සූරා මාඌන් අල් කුර් ආනයේ 107 වැනි සූරාව වේ. ( )
12. ''අජ්නබි'' යනුවෙන් හැඳින්වෙන්නේ විවාහ වීමට අවසර ලත් අය වේ. ( )
13. අලි (රලි) තුමා හසන් (රලි) තුමාගේ පුතණුවන් වේ. ( )
14. ''ඉබාදා'' යනුවෙන් හඳුන්වන්නේ සලාතය පමණක් වේ. ( )
15. සලාතය ඉටුකරනවිට එහි යම් දෙයක් අමතක වූවානම් ''සජ්දා සහ්වු'' කළ යුතු වේ. ( )

- A කොටසේ සඳහන් කරුණු අතරින් සුදුසු වචන B කොටසින් තෝරා ගළපන්න.

| A කොටස | B කොටස | |
|---|---|---|
| 16. අල් කුර් ආනය | ඉමාරත් | |
| 17. ෆර්දු කිෆායා | බිරිඳගේ සහෝදරිය | |
| 18. උලූල් අස්ම් | ආලිම්වරයෙක් බිහි කිරීම | |
| 19. ස්ථීර මහ්රම් | දැඩි අධිෂ්ඨාන ඇති අය | |
| 20. පොළොව සාරවත් කිරීම | කිරි අම්මා (ආච්චි) | (ල. 2×20=40) |

# ඉස්ලාම් - 8 ශ්‍රේණිය

## II කොටස

- දෙවැනි කොටසින් පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් සමග ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

**01. සියළු ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු සපයන්න.**

(i) නබි ඉබ්රාහීම් තුමාගේ බිරින්දෑවරුන් දෙපලගේ නම් සඳහන් කරන්න.

(ii) ආද්, සමූද් සමාජයන් විනාශ කිරීමට හේතු වූ කාරණාවන් කුමක්ද?

(iii) වලීමා ඉටුකරන අවස්ථාව කුමක්ද?

(iv) මහා පාපකර්ම දෙකක් සඳහන් කරන්න.

(v) අල් අමීන්, අස්සාදික් යන නම්වල අර්ථ සඳහන් කරන්න.

(vi) හදීස්හි කොටස් දෙකක් සඳහන් කරන්න.

(vii) වහීහි කොටස් දෙක සඳහන් කරන්න.

(viii) ''සජ්දා තිලාවත්'' ඉටුකරන අවස්ථාව සඳහන් කරන්න.

(ix) ''ආ මුල් හුස්න්'' වර්ෂය සමග සම්බන්ධ වූ දෙදෙනාගේ නම් සඳහන් කරන්න.

(x) ''සුනන් අර්බ ආ'' ලෙස හැඳින්වන ග්‍රන්ථ දෙකක් සඳහන් කරන්න. (ල. 2×10=20)

**02.** (i) සලාතයේ ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(ii) සකාත්, සදකා දෙක අතර තිබෙන වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

(iii) ''දු ආ'' ප්‍රාර්ථනා ඉටු කරන විට පිළිපැදිය යුතු ක්‍රම හතරක් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

**03.** (i) කිරි බී වැඩීම නිසා ඇතිවන සබඳතාවෙන් අනුමත නොකරන අයවලින් තිදෙනෙක් සඳහන් කරන්න.

(ii) යම් මුස්ලිම්වරයෙක් වැලකී සිටිය යුතු දුර් ගුණාංග තුනක් සඳහන් කරන්න.

(iii) යම් ශිෂ්‍යයෙක් පිළිපැදිය යුතු යහ ගුණාංග හතරක් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

**04.** (i) හලාල්, හරාම් යනු කුමක්ද?

(ii) නබි (සල්) තුමාණන්ගේ බිරින්දෑවරුන් තිදෙනෙක් සඳහන් කරන්න.

(iii) ''මව්ලූ හදීසයන්'' ඇතිවීමට හේතු හතරක් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

**05.** (i) සිත් මොලොක් වීමට හා අරමුණු ඉටුවීම සඳහාත් ආදරයෙන්, කරුණාවෙන් හැසිරිය යුත්තේ කවුරුන් සමග දැයි මුහම්මද් (සල්) තුමා හැඳින්වූයේ කව්රුන්ද?

(ii) අල්ලාහ් හා නබි (සල්) තුමාණන් තහනම් කළ මහා පාපකර්ම තුනක් සඳහන් කරන්න.

(iii) සමාජ සත්කාර හතරක් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

**06.** (i) ඉස්ලාම්හි අනුමත ගමන් තුනක් සඳහන් කරන්න.

(ii) ගමනක් යෑමේ දී පිළිපැදිය යුතු පිළිවෙල් තුනක් සඳහන් කරන්න.

(iii) ගමනක් යෑමේ දී ඉසිලිය යුතු දු ආවක් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

**07.** (i) උම්මහාතුල් මුඃමිනීන්වරුන් ලෙස හඳුන්වන්නේ කව්රුන්ද?

(ii) පොදු දේපල තුනක් සඳහන් කරන්න.

(iii) ඔබ දන්නා වූ සහාබාවරුන් හතරදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ල. 3+3+4=10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තුන්වන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 08 - 2023

# ඉස්ලාම්

පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. (ii) | 06. හීබ්රු | 11. ✓ | 16. වහී මත්ලූව් |
| 02. (i) | 07. මුඃජිසාත් | 12. ✓ | 17. ආලිම්වරයෙක් බිහි කිරීම |
| 03. (i) | 08. අබුල්බශර් | 13. ✗ | 18. දැඩි අධිෂ්ඨාන ඇති අය |
| 04. (i) | 09. දු ආ | 14. ✗ | 19. කිරි අම්මා (ආච්චි) |
| 05. (iv) | 10. අල් අමීන් | 15. ✓ | 20. ඉමාරන් |

## II කොටස

01. (i) හාජර්, සාරා
(ii) මහා පාපකර්ම නොකඩවා කිරීම
(iii) මනමාලයා, විවාහයෙන් පසු
(iv) හූනියම් කිරීම, මැරීම, පොලිය, වැරදි පද හැදීම (මඩ ගැසීම)
(v) විශ්වාසවන්තයා, සත්‍යවන්තයා
(vi) හදිස් කුද්සි, හදිස් නබවි
(vii) වහී මත්ලූව්, වහී ගෛරු මත්ලූව්
(viii) අල් කුර් ආනය පාරායන කරන විට, සජ්දාහි වදන් පාරායනය කරන විට
(ix) අබූ තාලිබ්, කදිජා
(x) තිර්මිදි, ඉබ්නු මාජා, නසර්, අබුදාවුද්

02. (i) පව් ඉවත් කරේ, ස්වර්ගය ලැබේ, ආලෝකය, ශරීර සුවය
(ii) **සකාත්**
1. අල්ලාහ් නියම කළ සුදුස්සන්ට හිමි වේ. (කණ්ඩායම් අටක්)
2. නිශ්චිත වස්තුවලට හිමි.
3. නිශ්චිත ප්‍රමාණ දැක් වේ.
4. නිශ්චිත කාලයක් නියම කෙරේ.

**සදකා**
1. සෑම කෙනෙකුටම දිය හැක
2. සෑම වස්තුවකටම
3. ප්‍රමාණයක් නොමැත
4. නිශ්චිත කාලයක් නොමැත

(iii) 1. වුලූ කර සිටීම
2. කිබ්ලාව දෙසට මූනලා සිටීම
3. හම්දු, සලමාත් උසුලා ආරම්භ කිරීම
4. පිරිසිඳු චේතනාවෙන් සිටීම

03. (i) කිරිදුන් ස්ත්‍රිය, කිරිදුන් ස්ත්‍රියගේ මව, කිරි බීමෙන් සබඳතා ඇති වූ සහෝදරිය, කිරිදුන් මවගේ දූවරුන්

(ii) බොරුව, ආඩම්බර වීම, වෛරය, ඊර්ෂයාව, කේලම් කීම,

(iii) දේව භක්තිය, සත්‍ය කථා කිරීම, පොරොන්දු ඉටු කිරීම, නිහතමානීකම

04. (i) ඉස්ලාම්හි අනුමැති දෑ හලාල්, තහනම් දෑ හරාම්

(ii) කදිජා, සව්දා, සෆීයා

(iii) රාජ්‍ය පාලකයින්ගේ හොඳ විශ්වාසය දිනා ගැනීම, ප්‍රසිද්ධිය ලබා ගැනීම

05. (i) අනාථයන් සමඟ

(ii) ෂිර්ක් තැබීම, හූනියම්, මැරීම, පොලිය

(iii) මස්ජිද් නිර්මාණය කිරීම, පාසැල් නිර්මාණය කිරීම, පුස්තකාල තැනීම, රෝහල් ඉදි කිරීම, සුභ සාධන මධ්‍යස්ථාන පිහිටුවීම.

06. (i) ඉපැයීම සඳහා, ඉගෙන ගැනීම සඳහා, නෑදෑ හිත මිතුරන් හමුවීම, යහපත් දේ ප්‍රචාරය කිරීමත්, අයහපත් දේවලින් වැලැක්වීමත් සඳහා, හජ්, උම්රා සඳහා

(ii) 1. පිරිසිදු චේතනා 2. අල්ලාහ්ගෙන් උපකාර පැතීම 3. අදහස් විමසීම
4. ණය පියවීම 5. සලාත පිළිබඳ විමසිලි වීම 6. අජ්නබි, මහ්රම් සීමාවන් අරක්ෂා කිරීම

(iii) 1. බිස්මිල්ලාහි තවක් කල්තු අලල්ලාහි .... 2. සුබ්හා නල්ලදී සක්කර ලහා හාදා

07. (i) නබි (සල්) තුමාගේ බිරින්දෑවරුන්

(ii) පාසැල්, රෝහල්, පුස්තකාල, මස්ජිදයන්

(iii) අබූ බක්කර් (රලි), උමර් (රලි), උස්මාන් (රලි), අලි (රලි), අබ්දුල්ලාහ් ඉම්නු මස් ඌද් (රලි)